


# ප්‍රජාතන්ත්‍රවාදය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, මාධ්‍ය නිදහස සහ **20 වැනි සංශෝධනය**

## ප්‍රකාශනය ගැන

''ප්‍රජාතන්ත්‍රවාදය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, මාධ්‍ය නිදහස සහ 20 වැනි සංශෝධනය" යන තේමාව යටතේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් සාකච්ඡා සභාවක් සංවිධානය කරන ලදී. එය පැවැත්වූයේ 2020 ඔක්තෝබර් මස 6 වැනිදාය. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ ශ්‍රවණාගාරයේ පැවැති එම සාකච්ඡා සභාවේදී ප්‍රධාන අදහස් දැක්වීම් තුනක් ඉදිරිපත් විය. 20 වැනි සංශෝධනයේ ආරම්භය සහ ගමන් මග සම්බන්ධයෙන් අදහස් දැක්වීම කරන ලද්දේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ විධායක කමිටු සාමාජිකයකු වන නීතිඥ ජගත් ලියනාරච්චි මහතා විසිනි. 20 වැනි සංශෝධනය අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට අභියෝගයක් වන ආකාරය සම්බන්ධයෙන් අදහස් දක්වන ලද්දේ නීතිඥ අර්මිසා ටීගල් මෙනෙවිය විසිනි. මාධ්‍ය සමාජයේ සාමාජිකයකු වශයෙන් 20 වැනි සංශෝධනය මාධ්‍ය නිදහසට සහ පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජනයක් ආකාරය සම්බන්ධයෙන් අදහස් දැක්වීම කරන ලද්දේ, අනිද්දා පුවත්පතේ කර්තෘ, නීතිඥ ජනරංජන මහතා විසිනි. 20 වැනි සංශෝධනයේ අනතුර සම්බන්ධයෙන් මාධ්‍ය සමාජය දැනුවත් වීමේ අවශ්‍යතාව අවබෝධ කරගත් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මෙම සාකච්ඡා සභාව සංවිධානය කළ අතර, වඩා පුලුල් පිරිසක් වෙත එම අදහස් සන්නිවේදනය කිරීමේ අරමුණ ඇතිව එදින සිදු කළ අදහස් දැක්වීම් මෙම ප්‍රකාශනයෙන් ඉදිරිපත් කර ඇත.



# 20 වෙනි සංශෝධනයේ වගන්ති 30ක් ප්‍රජාතන්ත්‍රවාදයට හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට අහිතකරයි!

**නීතිඥ අර්මිසා ටීගල්**

20 වන සංශෝධනයේ වගන්ති 30කට ආසන්න ප්‍රමාණයක් ප්‍රජාතන්ත්‍රවාදයට අහිතකර යැයි කියන්නට පුළුවන්. නමුත් ඉන් වගන්ති 3ක් ආශ්‍රයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට එය බලපාන ආකාරය ගැන අද මම සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙනවා.

20 වැනි සංශෝධනයේ 5 වන වගන්තියෙන් ජනාධිපතිවරයාට තිබෙන Immunity හෙවත් ජනාධිපතිවරයාට විරුද්ධව නඩු පැවරිය නොහැකිය යන වගන්තිය ඉදිරිපත් කර තිබෙනවා. 19 සංශෝධනයෙන් ජනාධිපතිවරයාට විරුද්ධව නඩු පැවරීමට හැකියාව ඇති කළා. මේ අනුව යම්කිසි අයිතිවාසිකමක් ජනාධිපතිවරයා විසින් කඩ කරන ලද අවස්ථාවකදි ජනාධිපතිවරයාට එරෙහිව අධිකරණයේදි නඩු පැවරිය හැකියි. ජනාධිපතිවරයා විසින් ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් නිදහස් කිරීමෙන් සන්ධ්‍යා එක්නැලිගොඩගේ මූලික අයිතිවාසිකම් කඩ වූ බවට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කිරීමට හැකියාව ලැබී ඇත්තේ මේ හේතුවෙනි. 20 සංශෝධනය මඟින් මෙම වගන්තිය ඉවත් කිරීමට යෝජනා කර ඇති අතර එතකොට අපට හිතා ගන්නට පුළුවන් ජනාධිපතිගේ බලතල වැඩි වෙනවා. ක්‍රියාකාරකම් වැඩි වෙනවා නඩු පැවරිය නොහැකි විධියේ ආරක්ෂාවක් ලැබෙන කොට. අපේ අයිතිවාසිකම් උල්ලංඝණය විම වැඩිවීමට තිබෙන ඉඩකඩත් වැඩි වෙනවා. එවිට පුරවැසියන්ට උසාවියකට යැමට නොහැකිවීම ගැටළුවක් වෙනවා.

එතන අදහස් දෙකක් තිබෙනවා. පුරවැසියන් සිය ඡන්දබලය පාවිච්චි කරමින් ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව පත් කරනු ලබනවා. නමුත් කිසිම අවස්ථාවක පුරවැසියන් සිය අයිතිවාසිකම් අන් සතු කරන්නේ නැහැ. ඒනිසා තම නියෝජිතයා ධුරය දරමින් සිය අයිතිවාසිකම් උල්ලංඝණය කළහොත් පුරවැසියන්ට එය ප්‍රශ්න කිරීමේ හැකියාව තිබෙනවා. එය කවදාවත් අහිමිවන්නේ නැහැ. එය සෘජු අයිතියක්.



> **ජනාධිපතිවරයා සිය බලතල අයුතු ලෙස පාවිච්චි කරනවාද නැද්ද යන්න පරික්ෂා කිරීමට අධිකරණයට තිබෙන බලය 20 වැනි සංශෝධනය නිසා අධිකරණයට අහිමි වෙනවා**

පුරවැසියන්ට ඕනෑම අවස්ථාවක විධායක ජනාධිපතිවරයාගෙන් ආරම්භ කොට ග්‍රාමනිලධාරී දක්වා ඔවුන්ගේ පරිපාලන කටයුතු නිසා පුරවැසියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වු විට නඩු පවරන්න පුළුවන්. 20 සංශෝධනය සම්මත වුවහොත් ජනාධිපතිවරයාට නඩු පවරන්නට තිබෙන අවස්ථාව පුරවැසියන්ට අහිමි වෙනවා.

අනිත් තර්කය තමයි මේ වගේ ආරක්ෂාවක් ජනාධිපතිවරයාට දුන්නොත් ජනාධිපතිවරයා සංවරණ හා තුලන ක්‍රමයකට යටත් කිරීමට අධිකරණයට තිබෙන බලය ද නැතිවන බව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නිර්මාණය කර තිබෙන ආයතන තුන වන ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය ඔවුනොවුන් සිය බලතල අයුතු ලෙස භාවිතා කරනවාද යන්න පිළිබඳව සැලකිල්ලෙන් සිටි. ජනාධිපතිවරයා සිය බලතල අයුතු ලෙස පාවිච්චි කරනවාද නැද්ද යන්න පරික්ෂා කිරීමට අධිකරණයට තිබෙන බලය 20 වැනි සංශෝධනය නිසා අධිකරණයට අහිමි වෙනවා.

දෙවැන්න 20 වැනි සංශෝධනයේ 24 වන වගන්තියෙන් කැබිනට් මණ්ඩලයට යම්කිසි පනතක් හදිසි නීතියක් ලෙසට යෝජනාවක් ඉදිරිපත් කළ හැකියි. මෙම වගන්තිය අනුව අධිකරණය පැය 24ක් ඇතුලත යෝජිත හදිසි පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිද නැද්ද යන්න තීරණය කළ යුතු වෙනවා. මේ අනුව පුරවැසියන්ට පැය විසිහතරක් ඇතුලත යම්කිසි හදිසි පනතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිද නැද්ද යන්න විමසීමට අධිකරණයට යාමට සිදුවෙනවා. මෙම සංශෝධනය අනුව ජනාධිපතිවරයා එම පැය 24 දින තුනක් දක්වා දීර්ඝ කළ හැකියි.

අද අපිට මෙවැනි හදිසි පනත් සම්බන්ධයෙන් අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමට දින 7 ලැබී තිබෙනවා. විස්සෙන් සිදුවන්නේ කුමක්ද? මෙම හදිසි පනත ඉදිරිපත් කරන්නේ පාර්ලිමේන්තුව විසින් නොව කැබිනට් මණ්ඩලය විසින් ඉදිරිපත් කිරීමත් සැලකිල්ලට ගත යුතුයි. ට්‍රාන්ස්පේරන්සි

වැඩසටහනකට පැමිණි පාර්ලිමේන්තු මහලේකම්වරයා වරක් ප්‍රකාශ කළා 1978 සිට 2011 හදිසි පනත් 128ක් මේ ආකාරයට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන බව. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, විශ්වවිද්‍යාල පනත, පාරිභෝගික ආරක්ෂක පනත, පළාත්පාලන විශේෂ විධිවිධාන පනත, මත්ද්‍රව්‍යය වෙළඳාමට එරෙහි පනත, මුදල් සංශෝධන පනත, එකතු කළ වටිනාකම මත බදු ගෙවීම පනත, සුරාබදු පනත, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ පනත යනාදි හදිසි පනත් ලෙස ඉදිරිපත් කර තිබෙන පනත් අතරින් කිහිපයක්. මෙම පනත් හදිසි පනත් ලෙස පැනවිය යුතු පනත්ද යන ප්‍රශ්නය තිබෙනවා. අධිකරණය විසින් ද කිහිප අවස්ථාවකදීම යම්යම් නඩු තීන්දුවලදි හදිසියේ සම්මත කළ පනත්වල දෝෂ සහිත බව ගැන සඳහන් කර තිබෙනවා. මෙය අයිතිවාසිකම් කඩවීමක් ලෙස දක්වා තිබෙනවා. අධිකරණයට එවැනි සඳහනක් කළ හැකි නමුත් ඊට එහාට යමක් කළ නොහැකියි.

වෙනත් රටවල්වල යම්කිසි පනතක් සම්මත වුණාට පසු පුරවැසියන්ට අයිතියක් තිබෙනවා යම්කිසි පනතක් සම්බන්ධයෙන් සිය අයිතිවාසිකම් කඩ වෙන බව පැමිණිලි කරන්නට. එය Post Enactment Judicial Review ලෙස හැඳින්වෙනවා. යම්කිසි නීතියක් පැනවුවාට පසුත් එම නීතිය නිසා අපේ යම් අයිතිවාසිකමක් උල්ලංඝණය වෙනවා නම් අපිට අපේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් අධිකරණයට යා හැකියි. නමුත් මෙම අවස්ථාව ශ්‍රී ලංකික පුරවැසියෙකුට කවදාවත් තිබිල නැහැ. 2015-2016 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මහජන අදහස් විමසුම් වාර්තාවට අනුව මෙරට පුරවැසියන්, සම්මත වු යම්කිසි පනතක් සම්බන්ධයෙන් අධිකරණයට ගොස් එම නීතියෙන් තම අයිතිවාසිකම් උල්ලංඝණය වන බවට වන ප්‍රශ්නය මතු කරන්නට අයිතිවාසිකමක් තිබිය යුතු බවට ඉල්ලා තිබෙනවා. අපිට එවැනි අයිතිවාසිකම් නැති අතර තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ඉතාමත් සීමිත වේලාවක් පමණයි පනතක් සම්බන්ධයෙන් ප්‍රශ්න කරන්නට. උදාහරණයක් වශයෙන් මඩකලපුවේ පුරවැසියෙකුට යම්කිසි හදිසි පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් අධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පැය 24 මදියි.

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා මාධ්‍ය සම්බන්ධ විෂයක් සම්බන්ධයෙන් යම්කිසි හදිසි පනත් කෙටුම්පතක් ගෙන ආවොත් ඒ සම්බන්ධයෙන් අධිකරණයට යාමට තිබෙන කාලය අප්‍රමාණවත් වීම පිළිබඳව ගැටළුවක් තිබෙනවා.

තුන්වැන්න 20 වැනි සංශෝධනයේ 20 වැනි වගන්තියේ මැතිවරණ කොමිෂන් සභාව ගැන සඳහන් වෙනවා. එම වගන්තියට රාජ්‍ය මෙන්ම පෞද්ගලික ගුවන්විදුලි, රූපවාහිනී, පුවත්පත් මාධ්‍ය අයිතිකරුවන් විසින් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන උපමාන පිළිපැදීමට බැඳී සිටිනවා. මෙම වගන්තිය ගැටළුවක් වන්නේ මැතිවරණ කොමසාරිස්වරයා පත් කරන්නේ ජනාධිපතිවරයා විසින් වීම නිසයි. අපි දන්නවා 20 සංශෝධනයට අනුව දැනට පවතින ව්‍යවස්ථාදයක සභාව අහෝසි වන අතර ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාවක් පිහිටුවනු ලබනවා. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන කොමසාරිස්වරයෙකු විසින් තමයි රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය සඳහා උපමාන නිකුත් කරන්නේ.

මේ තත්ත්වය යටතේ මැතිවරණ කොමසාරිස්වරයාගේ උපමාන අපගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට බලපාන්නේ කෙසේද යන්න සිතා ගත හැකියි.

# දේශපාලකයන් විසින් මාධ්‍යවේදීන්ගේ හිතීමේ සීමාව ලකුණු කරලා!

## අනිද්දා පුවත්පතේ කර්තෘ, නීතිඥ කේ.ඩබ්. ජනරංජන



මම මේ වේලාවේ අදහස් දක්වන්න බලාපොරොත්තු වෙන්නේ මාධ්‍ය සමාජයේ සාමාජිකයෙක් හැටියට 20 වැනි සංශෝධනය දකින්නේ කොහොමද කියන කාරණය ගැනයි. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ප්‍රජාතන්ත්‍රවාදයේම කොටසක් වන නිසාත්, ඒක වෙන් කරලා සලකන්නට බැරි නිසාත් පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදයට 20 වැනි සංශෝධනය නිසා ඇති වන බලපෑම තමයි අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියටත් බලපාන්නේ. ඒ වගේම මාධ්‍ය නිදහසටත් බලපාන්නේ. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදයට කරන බලපෑම ගැන මූලික අවබෝධයක් තබා ගැනීම ප්‍රයෝජනවත්.

මාධ්‍ය සමාජයේ සාමාජිකයෙක් ලෙසට මේ අවස්ථාවේ මාධ්‍යවල ප්‍රමුඛත්වය ලැබිය යුතු ප්‍රධාන මාතෘකා දෙකක් මම දකිනවා. එකක් අපි මුහුණ පා සිටින කොවිඩ්-19 පිළිබඳ ප්‍රශ්නය. දෙවන කාරණය 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය, මාධ්‍ය නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධයෙන්, ජනමාධ්‍යවේදයේ යෙදෙන මාධ්‍ය ආයතන, කර්තෘවරු, මාධ්‍යවේදීන්, ප්‍රවෘත්ති සංස්කාරකවරු මේ සියලු දෙනාම ප්‍රමුඛත්වයක් දිය යුතු කාරණයක්. හේතුව 20 වැනි සංශෝධනය මේ තියෙන විදියට නීතිගත වුණොත් මේ තරම් කාලයක් අපි අසීරුවෙන් ආරක්ෂා කර ගෙන පැමිණි, සීමා පුළුල් කරගත් ප්‍රජාතන්ත්‍රවාදය කියන කාරණය යුගයක් ආපස්සට හැරෙන්නට නියමිතයි. ඒ නිසා මේක මාධ්‍ය සමාජයේ වැදගත් ප්‍රශ්නයක් බවට පත් වීමට අවශ්‍යයි. සාකච්ඡා කළ යුතු, ස්ථාවරයක් ගත යුතු, මැදිහත් විය යුතු ප්‍රශ්නයක් ලෙස මාධ්‍ය සමාජය විසින් මේ කාරණය ගත යුතුයි.

අවසනාවකට අද ප්‍රධාන ධාරාවේ පුවත්පත් ගත්තත්, අනෙකුත් මාධ්‍ය ගත්තත් ඒ අයට වැදගත් මීට වඩා වෙනත් කාරණා. අනිත් අතට මෙම ප්‍රශ්නයට මාධ්‍ය මැදිහත් වීම දේශපාලකයින් විසින් සීමා කොට තිබෙන බව මම කියන්න කැමතියි. වෙනත් ආකාරයකට ප්‍රකාශ කළහොත් මධ්‍ය වාර්තා කරන්නේ දේශපාලකයින් 19 හා 20 වැනි සංශෝධනය ගැන කියන දේවල්. එහෙම නැතිනම් පළ කරන්නේ ඔවුන් කියන දේවල්. ඊට කිසිම ප්‍රශ්න කිරීමක් ඇතුලත් නැහැ. මාධ්‍යකරුවාගේ විචාර බුද්ධිය ප්‍රදර්ශනය කරන්නේ නැහැ. තමන්ගේ ස්ථාවරය පිළිබඳ අදහසක් ද ඉදිරිපත් කරන්නේ නැහැ. මේ නිසා මාධ්‍ය සමාජයේ සිතීමේ පරිමණ්ඩලය දේශපාලකයින්ගේ සිතීම සහ අදහස් විසින් සීමා කොට තිබෙනවා.

19 වැනි සංශෝධනය සම්බන්ධයෙන් ගත්තත් මාධ්‍ය විසින් ජනසමාජය වෙතට ගෙන ගියේ දේශපාලකයින්ගේ ප්‍රකාශ පමණයි. මෙම පණිවුඩවල අඩංගු වුයේ 19 වැනි සංශෝධනය පිළිබඳ නිශේධාත්මක මතයක්. ඉන් එක් පණිවුඩයක් නම් 19 වැනි සංශෝධනය නිසා තමයි පාස්කු ඉරිදා ප්‍රහාරය ඇති වුණේ යන්න. එය අමුලික බොරුවක්. අපි හොඳටම දන්නවා මෙම සිදුවීම් අතර කිසිම සම්බන්ධයක් නැති බව. තවත් පණිවුඩයක් නම් 2015-2019 දක්වා ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර ගැටුමක් ඇති වුණේ, 19 වැනි ව්‍යවස්ථාව නිසා කියන ඒක. ඒක අමුලික බොරුවක්. ඒ දෙක අතර කිසිම සම්බන්ධයක් නැහැ. ඒ ගැටුම ඇති වුණේ දෙදෙනාට බලය පිළිබඳ තිබු විජිගීෂාව, බලය පිළිබඳ තිබෙන තණ්හාව, පංති අතර තිබු පරතරය වැනි ප්‍රශ්න නිසා. 19වැනි සංශෝධනය සමඟ කිසිම සම්බන්ධයක් නැහැ.

කථානායක ධුරය වටා බල කේන්ද්‍රයක් නිර්මාණය වුණා යැයි කියන එක තවත් බොරුවක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා ලෙසට කථානායකවරයා ක්‍රියා කළාට කථානායකවරයා රාජ්‍ය බලකේන්ද්‍රයක් ලෙසට මතු වුණේ නැහැ. 2018 ඔක්තෝබර් 28 වන දින ඇතිවු ආණ්ඩුක්‍රම ව්‍යවසථා කුමන්ත්‍රණයේදි කථානායකවරයා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීමට ඉටු කළ කාර්යභාරය නිසා ඔහුට එකල විරුද්ධ පක්ෂ විසින් දැඩි චෝදනා එල්ල කළා. එක චෝදනාවක් තමයි කථානායකවරයා රට පාලනය කරන්නට පටන් ගත්තා කියන කාරණය. ඔහුට ඒ බලය ලැබුණේ ඔක්තෝබර් 28 වන දින ව්‍යවස්ථා කුමන්ත්‍රණය නිසා.

ඊළඟට ගෙන ආ තවත් චෝදනාවක් තමයි පොලිස්පතිවරයා 19වැනි සංශෝධනය නිසා ඉවත් කරන්නට බැරිය කියන කාරණය. මෙයත් අමුලික බොරුවක්. පොලිස්පතිවරයා ඉවත් කිරීම පිණිස 2002 අංක 02 නමින් වෙනම පනතක් තිබෙනවා. ඒ පනත අනුව ගිය ආණ්ඩුව හෝ මේ ආණ්ඩුව පොලිස්පතිවරයා ඉවත් කිරීමට ක්‍රියා කළේ නැහැ.

**"ඊළඟ වැදගත් කාරණය තමයි විධායක ජනාධිපතිවරයා නීතියට ඉහළින් ස්ථාපිත කරනවා. විධායක ජනාධිපතිවරයා ප්‍රශ්න කිරීමට තිබෙන ව්‍යවස්ථානුකූල මාර්ග නැති කරනවා"**

මේ ආකාරයට 19 වැනි සංශෝධනය නරක දෙයක් යැයි කියන්නට මතු කරපු සහ රෝපණය කරපු බොරු තමයි මාධ්‍යවේදීන් පුනරුච්චාරණය කරන්නේ. කවුරුත් මේක ප්‍රශ්න කරන්නේ නැහැ. මැති ඇමතිවරු මාධ්‍යයට වොයිස් කට් දීලා 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා පොලිස්පතිවරයා ඉවත් කර ගන්න බැරි බව කියන කොට මාධ්‍යවේදීන්ට අනිත් පැත්තට හැරිලා ඇයි ඒකට 2002 අංක 02 පනත තිබෙනවා නේද කියලා අහන්න බැහැ. අහන්න දන්නෙත් නැහැ. ඒ නිසා අවසානයට සිද්ධ වුණේ මාධ්‍යවේදීන්ගේ සිතීමේ සීමාව, මේ දේශපාලකයින් විසින් නියම කිරීමයි. මෙහි භයානක ප්‍රතිඵලය වුණේ මහජනතාව අතර 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ ජනමතයක් රෝපණය වීමයි. නමුත් ඇයි විරුද්ධ කියලා ඔවුන්ගෙන් ඇහුවොත් ඊට හේතු කියන්න දන්නේ නැහැ. ලංකාවේ සාමාන්‍ය ජනතාව අතර පමණක් නොව නීතිඥවරු, ආචාර්ය මහාචාර්යවරු වැනි ඉහළ මට්ටමේ අය පවා විරුද්ධව කථා කරන තත්ත්වයක් ඇති වුණා. 19 වැනි සංශෝධනය පිළිබඳ දේශපාලකයින්ගෙන් ප්‍රශ්න කිරීමට මාධ්‍යවේදීන් ගෙදර වැඩ කර නොතිබීම නිසා එහෙම නැත්තම් ඒ සඳහා අවශ්‍ය අවධානය සහ දැනුම තමන්ට නොතිබීම නිසා දේශපාලකයින්ගේ ප්‍රලාප ඒ ආකාරයෙන්ම සමාජ ගත කළා. මාධ්‍යවේදීන්ගේ පැත්තෙන් සිද්ධ වූ බරපතළම අවුල මෙය යැයි මා සිතනවා.

20 වැනි සංශෝධනය ගැන කතා කරන විට, තනි පුද්ගලයෙකුට ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල පවරා ගැනීමක් සිදු වෙලා තියෙන්නේ. මෙම සංශෝධනයෙන් විධායක බලය කේන්ද්‍රගත කරනවා පමණක් නොව වෙන් වෙන් වශයෙන් පැවතිය යුතු ආයතන තුනම විධායක බලයට නතු කරනවා. ඒ විතරක් නෙමෙයි, පවතින දේශපාලන සන්දර්භයට අනුව ඊට පවුලකුත් එකතු වෙනවා. පවුල සහ පුද්ගලයා වටා විධායක බලය කේන්ද්‍ර ගත කරනවා.

රාජ්‍ය ආයතනවලට තමන්ට කැමැති කැමැති ආකාරයට පුද්ගලයින් පත් කරන්නට20 වැනි සංශෝධනය හරහා විධායකයට බලය ලැබෙනවා. අධිකරණයට විනිසුරුවන් පත් කිරීමේ බලය ලබා ගැනීම සම්බන්ධයෙන් අපි වඩාත් සැලකිලිමත් විය යුතුයි. 1978 ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයා විධායක බලතලවලට අමතරව අධිකරණ විනිසුරුවන් පත් කිරීමේ බලය ගත්තා. ඒ වගේම අපි දන්නවා ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා මේ බලය භාවිතා කළ ආකාරය ගැන. මෙම බලය 19 වැනි සංශෝධනයෙන් ඉවත් කළා. දැන් යළිත් 20 වැනි සංශෝධනය හරහා අධිකරණයට විනිසුරුවන් පත් කිරීමේ බලය ජනාධිපතිවරයා විසින් ලබා ගත් විට ඔහු ජනතා පරමාධිපත්‍යයට ඉහළින් සිටින සුපිරි පාලකයෙක් බවට පත් වෙනවා. මෙම ක්‍රියාවලිය සනාථ කිරීම පිණිස 1978 ව්‍යවස්ථාවට ආපසු යාමක් කියන තර්කය ඉදිරිපත් කිරීම කිසිසේත්ම සාධාරණ වන්නේ නැහැ.

ඊළඟ වැදගත් කාරණය තමයි විධායක ජනාධිපතිවරයා නීතියට ඉහළින් ස්ථාපිත කරනවා. විධායක ජනාධිපතිවරයා ප්‍රශ්න කිරීමට තිබෙන ව්‍යවස්ථානුකූල මාර්ග නැති කරනවා. අවසාන වශයෙන් විධායක ජනාධිපතිවරයාට තමා යටතේ තිබෙන කිසිම ආයතනයක් පිළිබඳ වගකීමක් හෝ වගවීමක් පැවරෙන්නේ නැහැ.

20 වැනි සංශෝධනය සම්බන්ධයෙන් ආණ්ඩුව පැත්තෙන්ම පැන නැගී ඇති විරෝධතාවලද විශේෂ ලක්ෂණයක් තිබෙනවා. ඔවුන් ප්‍රශ්න කරන්නේ 20වැනි සංශෝධනයේ හරය නෙමෙයි. ඔවුන්ගේ විරෝධය තිබෙන්නේ ද්විත්ව පුරවැසිභාවය, විගණන කොමිසම අහෝසි කිරීම වැනි අංග සම්බන්ධයෙන්. මිනිසුන්ට ළඟා වීමට නොහැකි ඒකා-අධිපති පුද්ගලයෙක් 20 වැනි සංශෝධනය මගින් නිර්මාණය කිරීමයි අප විසින් ප්‍රශ්න කළ යුත්තේ.

20 සම්බන්ධයෙන් කරන විවේචනවලට විරුද්ධව ඉදිරිපත් කරන තවත් තර්කයක් නම්, 20වැනි ව්‍යවස්ථා සංශෝධනයේ අන්තර්ගතය 18වැනි සංශෝධනයේ තිබූ දෙයක්, එසේ නැතිනම් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගතව තිබූ දෙයක් නිසා අළුත් දෙයක් නොවන බව. එහෙම නැත්නම් ඊළඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන තෙක් කරන තාවකාලක සංශෝධනයක් යැයි තවත් බොරුවක් කියනවා. ඒ ගැන අපි වෙනම කථා කරන්න අවශ්‍යයි.

තර්කයක් වශයෙන් 1978 ව්‍යවස්ථාවේ සහ 18 වැනි ව්‍යවස්ථාවේ මෙම කාරණා තිබුණායැයි කීමෙන් මෙම ව්‍යවස්ථා සංශෝධනයේ භයානකකම අඩු වෙන්නේ නැහැ. ඊට හේතුව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය කියලා එකක් දැන් නැහැ. 17ක් හෝ 18 නැහැ. එම ව්‍යවස්ථා සංශෝධන මගින් ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් වී දැන් අපිට තිබෙන්නේ මේ මොහොතේ තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. මේ නිසා අපි විමසා බැලිය යුත්තේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන විධිවිධානවලට, ජනතා පරමාධිපත්‍යයට 20 වැනි සංශෝධනයෙන් හානියක් වනවාද නැද්ද යන කාරණයයි. අපේ ව්‍යවස්ථාවේ පාලන බලතල ඇතුලේ ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යනුවෙන් බල කේන්ද්‍ර තුනක් සහ මූලික අයිතිවාසිකම් සහ ඡන්දබලය යනුවෙන් ජනතා පරමාධිපත්‍ය ඇතුලේ බල කේන්ද්‍ර දෙකක් තිබෙනවා. ව්‍යවස්ථාදායක විධායක බලතල ජනතාවගේ නියෝජිතයින් හරහා ක්‍රියාත්මක කරනවා. නමුත් මූලික අයිතිවාසිකම් සහ ඡන්දබලය එසේ දෙන්නේ නැහැ. මෙම බලතල දෙක කිසි කෙනෙකුට පවරා නොදෙන්නේ ඒක ඒ තරම්ම වැදගත් නිසා.

20වැනි සංශෝධනය විසින් මෙම ජනතාව සන්තකයේ තිබෙන බල කේන්ද්‍ර දෙක පවා සීමා කරනවා. 20 වැනි සංශෝධනය අනුව ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායක හා අධිකරණ බලතල පමණක් නොව ජනතාව සන්තකයේ තිබෙන අයිතිවාසිකම් පවා සීමා කිරීමට හැකි වන බව අපි සැලකිල්ලට ගත යුතු වෙනවා. මෙය උදාහරණයකින් පැහැදිලි කරන්න පුළුවන්. කලිනුත් කියපු විදිහට 20ට පක්ෂව ඉදිරිපත් කරන ප්‍රධාන තර්කය තමයි ''ජනාධිපතිට අසීමිත විධායක බලයක් 1978 ව්‍යවස්ථාවෙන් සහ 18 වැනි සංශෝධනයෙන් ලැබී තිබුණා, එය සීමා කළේ 19 යෙන්, ඒනිසා 19 ඉවත් කළාම අපි ආයෙත් 18ට යනවා.'' කියන කාරණය. නමුත් මෙහිදී සැලකිල්ලට ගත යුතු කාරණය තමයි 19 දැන් අපේ ජනතා පරමාධිපත්‍යයේ කොටසක්. ඒනිසා 20න් කරන්නේ ජනතා පරමාධිපත්‍ය උදුරා ගැනීමක් යන්න තේරුම් ගත යුතුයි.

20 වැනි සංශෝධනයට පක්ෂව ජනාධිපතිවරයාම ඉදිරිපත් කරන තර්කය නම් තමාට ලැබුණ ජනවරම ක්‍රියාත්මක කරන්නට 19 බාධාවක් වන බවයි. ජනාධිපතිවරයාට ලක්ෂ 69ක ජනවරමක් ලැබුණ බව ඇත්ත. තවත් ලක්ෂ 63 ජනතාවක් ඔහුට විරුද්ධව ඡන්දය දී තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ අර ලක්ෂ 69 පමණක් නොවෙයි. අනෙක් ලක්ෂ 63ත් මේ ප්‍රජාතන්ත්‍රවාදයේ කොටස්කාරයෝ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ රටේ මූලික නීතිය වන නිසා ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන එන කොට අර ලක්ෂ 69 ගැන පමණක් නොව ඉතිරි ලක්ෂ 63 ගැනත් බලන්න වෙනවා.

ජනමාධ්‍යකරුවන් මේ කාරණා අවධාරණය කරනවා ද කියන ප්‍රශ්නය අහන්න වෙනවා.

මම හිතන්නේ දේශපාලකයින් විසින් මාධ්‍යවේදීන්ගේ හිතීමේ සීමාව ලකුණු කරන නිසා මාධ්‍යවේදින් එක් එක් දේශපාලකයා

කියන දෙය වාර්තා කරමින් යනවා. නමුත් 20 වැනි සංශෝධනය පිළිබඳව තමන්ගේ ම මිනුම් දණ්ඩක් මාධ්‍යවේදීන්ට නොමැති බවයි පෙනෙන්නේ.

මාධ්‍යවේදීන් ලෙසට අපේ කාර්යභාරය මහජන සුභසිද්ධිය (Public Interest) වෙනුවෙන් පෙනී සිටිමයි. මාධ්‍යවේදීන්ට කවර ප්‍රශ්නයකදි වුවත් පොදු යහපත වන්නේ කුමක්ද යන්න පිළිබඳ තමන්ගේම මතයක් තිබිය යුතුයි. අපගේ වෘත්තීය ජීවිතයේදි කරන්නේ අපට ලැබෙන සෑම ප්‍රවෘත්තියක්ම මහජන සුභසිද්ධියට ගැලපෙන්නේ කෙසේද යන්න කිරා බලා තිරණය කිරිමයි. ජනමාධ්‍යවේදින්ට මහජන සුභසිද්ධිය පදනම් කොට ගත් ස්ථාවරයක් තිබිය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදයට හානියක් කරනවා නම් හෝ ප්‍රජාතන්ත්‍රවාදයට සීමාවක් ඇති කරනවා නම් අපි එය සැලකිය යුත්තේ මහජන සුභසිද්ධියට කරන හානියක් ලෙසටයි. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට හානියක් වනවානම් අපි එය මහජන සුභසිද්ධියට වන හානියක් ලෙස සැලකිය යුතුයි. නීතියට ඉහළින් ඉන්න පුද්ගලයෙක් නිර්මාණය කරනවා නම් අපි එය සැලකිය යුත්තේ මහජන සුභසිද්ධියට හානි කර කාර්යයක් ලෙසටයි. මාධ්‍යවේදීන් ලෙසට මහජන සුභසිද්ධිය කියන මිනුම්දණ්ඩ අපේ අතේ තිබිය යුතුයි. තමන් කැමති දේශපාලකයා කවුද, තමන් කැමති දේශපාලන පක්ෂය කුමක්ද, තමන් කැමති දේශපාලන දර්ශනය කුමක්ද යන්න අදාළ කර ගත යුතු නැහැ අර ඉහත කී මුලික මිනුම්දණ්ඩට. ජනමාධ්‍යවේදීන් කියන්නේ ජනතාවගේ පරමාධිපත්‍ය වෙනුවෙන් පෙනී සිටින පිරිසක් නම් ඔවුන් අර මුලික මුලධර්ම මත පදනම්ව තම මාධ්‍ය ක්‍රියාකාරිත්වය තීරණය කළ යුතුයැයි මා යෝජනා කරනවා.

මේ අනුව 20වැනි සංශෝධනය ගැන අපි ප්‍රශ්න අහන්න වෙනවා.

- 20 වැනි සංශෝධනය රටේ ප්‍රජාතන්ත්‍රවාදයට හානි කරනවා. ඔව් ද නැද්ද?
- 20 වැනි සංශෝධනයෙන් තනි පුද්ගලයෙකුට බලයක් ලැබෙනවා. පවුලකට බලයක් ලැබෙනවා. ඔව්ද නැද්ද?
- 20 වැනි සංශෝධනය යටතේ ජනාධිපතිවරයාට අධිකරණයට පත් කිරීම් කරන්නට බලයක් ලැබෙනවා. ඔව් ද නැද්ද?
- 20 වැනි සංශෝධනය නිසා පාර්ලිමේන්තුවේ පරමාධිපත්‍ය බලය සීමා වෙනවා. ඔව් ද නැද්ද?

ජනතාවගේ පරමාධිපත්‍ය බලය පාර්ලිමේන්තුව සතු අතර ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට බලයක් ලැබෙන්නේ කෙසේද යන්න මට නං ප්‍රශ්නයක්. පාර්ලිමේන්තුව හරහා ජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක වෙනවා නම් ජනාධිපතිවරයාට හිතු හිතු වේලාවට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට බලයක් තිබෙන්න බැහැ. ජනාධිපතිවරයාට නව පාර්ලිමේන්තුවක් විසුරුවා හැරීමට තිබෙන බලය පිළිබඳ පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. 20 වැනි සංශෝධනයේ දක්වා ඇති ආකාරයට නව පාර්ලිමේන්තුවක් වසරක කාලයක් තුළ ජනාධිපතිවරයාට විසුරුවා හැරිය නොහැකියි. නමුත් ඉන් අදහස් කරන්නේ ඊට පෙර පාර්ලිමේන්තුව සිය ධුර කාලයට පෙර විසුරුවා හැරිය පාර්ලිමේන්තුවක් නම් පමණයි, ජනාධිපතිවරයාට නව පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිණිස වසරක කාලයක බලා ගෙන සිටිය යුත්තේ. මෙරට පාර්ලිමේන්තු ඉතිහාසය තුළ පාර්ලිමේන්තු සිය ධුර කාලය අවසන් වීමට පෙර විසුරුවා හැරිය අවස්ථා විරලයි. සාමාන්‍යයෙන් බොහෝ පාර්ලිමේන්තු සම්පුර්ණ ධුර කාලයම කටයුතු කොට තිබෙනවා. එවැනි පාර්ලිමේන්තුවකට පස්සේ අළුතින් පත් වන නව පාර්ලිමේන්තු ඕනෑම අවස්ථාවක

ජනාධිපතිවරයාට විසුරුවා හැරිය හැකියි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයා ලබා ගෙන තිබෙන බලය ජනතා පරමාධිපත්‍ය පැත්තෙන් ඉතාමත් අසාධාරණ බලයක්. කාරක සභා අවස්ථාවේ සංශෝධන ලෙස පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය අවුරුදු 2යි මාස 6ක් දක්වා ඉදිරියට ගෙන යන බව සඳහන් වෙනවා. නමුත් මම හිතන්නේ ජනාධිපතිවරයාට පාර්ලිමේන්තු විසුරුවා හැරීමට බලයක් තිබිය යුතු නැහැ. මෙය ඉතාමත් භායනක දෙයක්. ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හරින්න තිබෙන බලය නිසා පාර්ලිමේන්තුව ඔහුට අවනත කර ගත හැකියි. පාර්ලිමේන්තුව ජනාධිපතිවරයා අකමැති දේවල් කළහොත් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකියි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තමන්ගේම මරණ වරෙන්තුව තමන් විසින්ම ලියා ගන්න තත්ත්වයට පත් වී තිබෙනවා.

20 වැනි සංශෝධනය පිළිබඳ මෙම කාරණා සැලකිල්ලට ගත් විට අපි මූලධර්ම මත ප්‍රශ්න කළ යුතු දේවල් තිබෙනවා. වත්මන් ජනාධිපතිවරයා සහ අගමැති සහෝදරයෝ නිසා පාර්ලිමේන්තුව සහ ජනාධිපති අතර ගැටුම් නිරාකරණය කර ගනු ඇතැයි යන තර්කය භායනක වන්නේ මේ නිසයි. තමන් විපක්ෂයේ සිටින අවස්ථාවක මේ බලය තිබෙන ජනාධිපති කෙනෙක් බලයේ සිටියහොත් කුමක් විය හැකිදැයි වත්මන් ආණ්ඩු පක්ෂය කවර හෝ අවස්ථාවක සිතනවාද? තමන්ට උසාවියකට යන්න බැහැ ජනාධිපතිවරයා තමයි විනිශ්චයකාරවරුන් පත් කරන්නේ. ජනාධිපතිවරයාට ඉහළ අධිකරණවලට පමණක් නොව පහළ මහේස්ත්‍රාත් අධිකරණවලට පවා විනිශ්චයකාරවරුන් පත් කිරීමට බලයක් ලැබෙන්නේ අධිකරණ සේවා කොමිසන් සභාව තමන් යටතට ගන්නා නිසයි. අධිකරණ සේවා කොමිසන් සභාව පත් කරන්නෙත් ජනාධිපතිවරයා. ජනාධිපතිවරයාට එහි සාමාජිකයින් තමාට අවශ්‍ය අවස්ථාවල හේතු දක්වා ඉවත් කළ හැකියි. බලය තිබෙන ජනාධිපති කෙනෙක් පත් කරලා ඊළඟට ගිහින් විපක්ෂයේ වාඩි වුණාම අළුත් ජනාධිපති විපක්ෂයට ෆ්ල්ට් වෙන්ඩ ගහලා දමනු ඇත. මේක තේරුම් නොගෙන තමන්ට බලය තිබෙන වේලාවට මේ ආකාරයට හැසිරීම නිසා අපි විශාල අර්බුදයකට යන්නේ.

දේශපාලකයින් තමන් විපක්ෂයේ ඉන්න කොට විධායක ජනාධිපති ක්‍රමයට විරුද්ධයි. එළඹෙන මැතිවරණයකදී තමන්ට බලය ලබා ගැනීමට සුළු හෝ අවස්ථාවක් ඇතැයි තක්සේරුවක් තිබුණොත් මැතිවරණ ප්‍රකාශනයටවත් ජනාධිපති ධුරය අහෝසි කිරීම ගැන ඇතුල් නොකරන බව පෙනී ගොස් තිබෙනවා. විරුද්ධ පක්ෂයේ ඉන්න කොට ජනාධිපතිවරයා ප්‍රහාර එල්ල කරන කොට ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට කථා කරනවා. ගෝඨාභය රාජපක්ෂ තමන්ගේ මැතිවරණ ප්‍රකාශනයේ කිසිම තැනක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බව සඳහන් කර නැහැ. සජිත් ප්‍රේමදාස තමන්ගේ මැතිවරණ ප්‍රකාශනයේ ජනාධිපති ක්‍රමය අහෝසි කරන බව පැහැදිලිව කියා නැහැ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන්නෙත් සියලු පාර්ශවයන් විමසා බලා සුදුසු තීරණයක් ගනු ඇත යන දියාරු වගන්තියක්. ජනාධිපති ක්‍රමය එහි ආරම්භයේ සිටම විවේචනයට භාජනය වුණා වගේම, ජනාධිපති ක්‍රමය ජනතා පරමාධිපත්‍යයට හානි කරයි කියන්නා, වගේම එය වෙනස් කිරීම පිණිස අවශ්‍ය දේශපාලන අධිෂ්ඨානය අපේ දේශපාලනඥයින්ට නැති බව කියන්න වෙනවා.

මෙම විෂය ගැන දිගින් දිගටම කථා කළ හැකියි.

නමුත් මට අවධාරණය කරන්නට සිදු වී තිබෙන්නේ මෙවැනි වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් මාධ්‍යකරුවන්ට ස්ථාවරයක් තිබිය යුතුයි. මම වාර්තා කරන කොට, සම්මුඛ

සාකච්ඡා ගන්න කොට ඒවායින් පෙනී යනවා යම්කිසි ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මම ඉන්න ස්ථාවරය කුමක්ද කියලා. ජනමාධ්‍යවේදීන් හැටියට මහජන සුභසිද්ධිය යන මූලික සිද්ධාන්තය මත නම් තීන්දු තීරණ ගන්නේ අපේ වෘත්තීය පවත්වා ගෙන යන්නේ; 20 වැනි සංශෝධනය විශ්ලේෂණය කරන කොට ප්‍රජාතන්ත්‍රවාදය අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස නීතියේ පාලනය තනි පුද්ගලයෙකුට බලය ලැබීම යන මේ සියලු කාරණා ජනමාධ්‍ය ක්ෂේත්‍රයට ඉතා විනාශකාරි ප්‍රතිඵල ලබා දෙන බව කිය යුතුයි. ඒ වගේම 20 වැනි සංශෝධනය රටක් හැටියට ඉතාමත් විනාශකාරි ප්‍රතිඵල අත්කර දෙන ව්‍යවස්ථා සංශෝධනයක් යැයි කිව හැකියි.

ප්‍රමාද වි හෝ ජනමාධ්‍යවේදීන් සිය වගකීම සියතට ගත යුතුයි.

**ලක්ෂ 69ක ජනවරමක් ලැබුණ බව ඇත්ත. තවත් ලක්ෂ 63 ජනතාවක් ඔහුට විරුද්ධව ඡන්දය දී තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ අර ලක්ෂ 69 පමණක් නොවෙයි. අනෙක් ලක්ෂ 63ත් මේ ප්‍රජාතන්ත්‍රවාදයේ කොටස්කාරයෝ.**



# 20 වැනි සංශෝධනය ආරම්භය සහ එහි ගමන් මග

## නීතිඥ ජගත් ලියනාආරච්චි



20 වැනි සංශෝධනය ආරම්භය, එහි ගමන් මග සහ කාලවකවානු පිළිබඳ මතකය අළුත් කර ගැනීම කරන්නටයි මම උත්සාහ දරන්නේ. එය ඉදිරි සාකච්ඡාවලට ප්‍රයෝජනවත් වනු ඇතැයි විශ්වාස කරනවා.

2019 නොවැම්බර් ජනාධිපති මැතිවරණයට පාවිච්චි කළ මැතිවරණ ප්‍රකාශනය 2020 මහ මැතිවරණයට එලෙසින්ම පාවිච්චි කළා. එහි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගැන මිස 20වැනි සංශෝධනයක් ඉදිරිපත් කිරීමක් ගැන සඳහන් වන්නේ නැහැ. 1978 ව්‍යවස්ථාවේ තිබු දෝෂ නිවැරදි කිරීමට ගෙන ආ 19 සංශෝධනය භයානක වු නිසා ඉදිරියට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කරද්දි පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවල නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් සහ පුළුල් මහජන සහභාගිත්වයක් ඇතිව කරන බවත් එහි සඳහන් වි තිබෙනවා. ඒ අනුව සෞභාග්‍යයේ දැක්ම ප්‍රකාශනයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන බවයි අවධාරණය කර තිබෙන්නේ. නමුත් මැතිවරණ ප්‍රචාරක වේදිකාවේ 19 සංශෝධනය ඉවත් කර 20 වැනි සංශෝධනයක් ගෙනෙන බව බරපතල විධියට මතු කළා. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කිරීමේ තාක්ෂණික ප්‍රවේශය ලෙසට 20 වැනි සංශෝධනය ගෙන එනවා.

1978 ව්‍යවස්ථාව මේවන විට 19 වතාවක් සංශෝධනය කොට තිබෙනවා. මෙම සංශෝධන අතර 12 වැනි සංශෝධනයක් ගැන සඳහන් වුවත් එවැනි සංශෝධනයක් නොමැති නිසා ඇත්ත වශයෙන්ම ව්‍යවස්ථාව සංශෝධනය වී ඇත්තේ 18 වතාවක් යැයි කිව හැකියි. 13, 17, 19 හැරුණාම අනෙක් සියලුම සංශෝධනවලින් උත්සාහ කොට තිබෙන්නේ විධායක බලතල වැඩි කර ගැනීමට බව

පේනවා. 13 වන සංශෝධනය ශ්‍රී ලංකා රජය විසින් සවාධීනව ගත් තීරණයක ප්‍රතිඵලයක් නොවන අතර ඉන් අපේක්ෂා කළේ මෙරට ජනවාර්ගික ගැටළුවට විසඳුමක් ලෙස ඉන්දියාව සමඟ අත්සන් කළ ඉන්දුලංකා ගිවිසුමේ ප්‍රකාර බලය විමධ්‍යගත කිරීමයි. 17 සහ 19 ව්‍යවස්ථා සංශෝධනවලින් උත්සාහ කොට තිබෙන්නේ විධායක බලය යම්කිසි සංවරණ හා තුලන ක්‍රමයකට ලක් කිරීමටයි. අනෙක් සියලුම ව්‍යවස්ථා සංශෝධන වලින් කර තිබෙන්නේ 1978 ව්‍යවස්ථාවේ විධායක බලතල තවත් වැඩි කිරීමයි. නමුත් ව්‍යවස්ථා සංශෝධකයින්ගේ තර්කය වුයේ තමන් 1978 ව්‍යවස්ථාවේ විධායක බලතල අඩු කිරීමට උත්සාහ දරන බවයි. මේ තත්ත්වය වෙනස් වුණේ 17 වන සංශෝධනයෙන්. 18 වන සංශෝධනයෙන් නැවත විධායක බලතල වැඩි කර ගත්තා. 19 ව්‍යවස්ථාවෙන් නැවත විධායක බලතල අඩු කිරීම, රාජ්‍ය සේවය සවාධීන කිරීම වැනි අංග රැසක් හඳුන්වා දුන්නා.

මෙය ආපිට පෙරලීමටයි 20 සංශෝධනය මඟින් උත්සාහ කරන්නේ. 20 වැනි සංශෝධනය මහජනතාව අතට පළමුවතාවට නෛතික ලියවිල්ලක් ලෙසට ඉදිරිපත් වන්නේ සැප්තැම්බර් මස 02දා ගැසට් පත්‍රයේ අතිරේකයක් ලෙසට පළවන විටයි. මෙම ලියවිල්ලට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණ බව මාධ්‍ය විසින් ප්‍රකාශයට පත් කළා. සැප් 22 දින අධිකරණ අමාත්‍යවරයා විසින් මෙම 20 වැනි සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. මෙහිත් විශේෂත්වයක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මෙතෙක් ඉදිරිපත් කොට තිබෙන්නේ අගමැතිවරයා විසින් පමණයි. ඊට හේතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනු ආණ්ඩුවකට ඉතාමත් තීරණාත්මක කාර්යක් වන නිසා සාමාන්‍යයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කරන්නේ අගමැතිවරයා විසිනුයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ ව්‍යවස්ථා සංශෝධනත් තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ විසින් ද 20 ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙනවා. දිනේෂ් ගුණවර්ධන මහතා 12 වන ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කර තිබෙනවා. මේ පනත් දෙකම සම්මත වුණේ නැහැ. නමුත් ආණ්ඩුවක් විසින් ඉදිරිපත් කරන ව්‍යවස්ථා සංශෝධන සියල්ලම ඉදිරිපත් කර තිබෙන්නේ අගමැතිවරයා විසින් වන අතර ගැසට් පත්‍රයේ පළ කරන්නේත් අගමැතිවරයාගේ නමින්. මෙවර තිබෙන විශේෂත්වය නම් අධිකරණ ඇමැතිවරයාගේ නමින් ගැසට් පත්‍රයේ පළ කිරීමත් අධිකරණ ඇමතිවරයා විසින්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමත්.

මෙම ඉදිරිපත් කිරීමට පෙර අගමැතිවරයා විසින් 20වන ව්‍යවස්ථා සංශෝධනය අධ්‍යයනය කිරීම පිණිස කමිටුවක් පත් කරනු ලැබුවා. මෙම කමිටුවට අධිකරණ ඇමැතිවරයාත් කැබිනට් ඇමතිවරු කිහිප දෙනෙක් සහ කැබිනට් නොවන ඇමතිවරු කිහිප දෙනෙකුත් ඇතුලත් වුණා. කැබිනට් මණ්ඩලය විසින් සම්මත කළ පනත් කෙටුම්පතක් කැබිනට් මණ්ඩලයේ ම සාමාජකයෙක් වන අගමැතිවරයා විසින් කැබිනට් සහ කැබිනට් නොවන ආමාත්‍යවරුන්ගෙන් යුත් කමිටුවක් පත් කරන්නේ ඇයිද යන්න ගැටළුවක්. මෙම වාර්තාවෙහි අඩංගු කරුණු පිළිබඳව මාධ්‍යවල වාර්තා පළ වුවත් අවසානයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන්නේ ගැසට් පත්‍රයේ පළ කළ කෙටුම්පතයි.

පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළාට පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව දින හතක් ඇතුලත පුරවැසියෙකුට එම පනත් කෙටුම්පතෙහි ව්‍යවස්ථානුකූලභාවය පරික්ෂා කිරීම පිණිස අධිකරණයට යා හැකියි. මේ අනුව පෙත්සම් 39 අධිකරණයට ගොනු වෙනවා. ඉන් 37 විභාගයට ගන්නවා. දින පහක් තිස්සේ විභාග කොට

පෙත්සම් විභාගය ඔක් 06 දින අවසාන කරනවා. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම පෙත්සම් සලකා බලා 20 සංශෝධනයේ තිබෙන සියලුම අඩුපාඩු සකස් කොට ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වන ආකාරයේ නිර්දේශ ඉදිරිපත් කිරීමක් කරනු ඇතැයි කෙනෙක් තුළ විශ්වාසයක් තිබිය හැකියි. අධිකරණයේ කාර්යභාරය වන්නේ ගැසට් පත්‍රයේ පළ කර තිබෙන පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ ගැටෙනවා ද නැද්ද යන්න සහ පනත සම්මත කර ගැනීම පිණිස පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දය පමණක් ප්‍රමාණවත් ද එසේත් නැත්නම් ජනමත විචාරණයකට යා යුතුද යන්න පරීක්ෂා කර බැලීමයි. එලෙසම ජනමත විචාරණයකට නොගොස් පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට නම් වගන්ති සංශෝධන විය යුතු ආකාරය නිර්දේශ කළ හැකියි. නමුත් මෙම සංශෝධන නොගෙන ආ යුතුයැයි නිර්දේශ කිරීමට බලයක් ශ්‍රේෂ්ඨාධිකරණයට නැහැ. අධිකරණයට පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීම පිණිස අවස්ථාවක් ලබා ගැනීම වැදගත්. එක් අතකින් පුරවැසියන් සිය අයිතිය භාවිතා කරන අවස්ථාවක් විමත් අනෙක් අතට ප්‍රජාතන්ත්‍රවාදී පනත් ඉදිරිපත් කිරීමටත් ඉන් අවස්ථාවක් උදා වෙනවා.

පෙත්සම් විභාගය ආරම්භ වූ ප්‍රථම දිනයේම නීතිපතිවරයා විසින් අධිකරණයට 20 වැනි සංශෝධනයේ කාරක සභා අවස්ථාවේදී ආණ්ඩුව ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන සංශෝධන ලැයිස්තුවක් ඉදිරිපත් කරනවා. මාධ්‍ය විසින් ප්‍රකාශයට පත් කොට ඇති එම ලේඛනය පරීක්ෂා කරන විට පෙනී යන කාරණයක් නම් එය හරියට අතීතයේ පොත් ප්‍රකාශයෙක් විසින් සිය පොත් අගට එකතු කළ ශුද්ධි පත්‍රයට සමාන බවයි. 20 සංශෝධන මුල් කෙටුම්පතෙහි තිබූ තාක්ෂණික ගැටළු විසඳා ගැනීමට දරන ලද උත්සහායක් ලෙස එම ලේඛනය හැඳින්විය හැකියි. මේ ගණයට අයත් නොවන සංශෝධන දෙකක් තිබෙනවා. එකක් නම් විගණකාධිපතිවරයාගේ විගණනය ජනාධිපති කාර්යාලය සහ අගමැති කාර්යාලය ඇතුලත් කර තිබෙනවා. පත් කිරීම් සම්බන්ධනේ පාර්ලිමේන්තු සභාවේ උපදෙස් නොව නිර්දේශය ලබා ගත යුතුයැයි සඳහන් කර තිබෙනවා.

20 වන සංශෝධනයේ අඩංගු මූලික ලක්ෂණ කිහිපයක් පැහැදිලි කිරීමට ද අවස්ථා ගත යුතුයි.

මෙම සංශෝධනය විසින් විධායකයේ බලතල වැඩි කිරීමටත් පාර්ලිමේන්තුවේ බලතල අඩු කිරීමටත් ප්‍රයත්නයක් දරා තිබෙන බව පෙනී යනවා. එසේම ඊට සාපේක්ෂකව ජනාධිපතිවරයාගේ බලතල වැඩි වන විට ඔහුට පාර්ලිමේන්තුවට, මහජනතාවට තිබෙන වගවීම ලිහිල් කර තිබෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීම මගින් ව්‍යවස්ථාවේ ආකෘතිමය වෙනසක් සිදු වීමත් තවත් වැදගත් ලක්ෂණයක්. 20වන සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කොට පාර්ලිමේන්තු සභාව පිහිටවනු ලබනවා. මෙය අපේ සමාජය තුළ විශාල වෙනසක් ඇති වෙන්නට පුළුවන් කාරණයක්. ව්‍යවස්ථා සභාව යටතේ තිබූ රාජ්‍ය ආයතන විධායකය විසින් පාලනය කරන වටපිටාවක් 20 වැනි සංශෝධනය මගින් ඇති කරනු ලබනවා.

20 වන සංශෝධනය ගෙන ඒම පිණිස 19වන ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ බොහෝ විවේචන සම්බන්ධයෙන් මගේ නිරීක්ෂණය වන්නේ, එය ජනාධිපති සහ අගමැති අතර ඇති වූ බල අරගලයක ප්‍රතිඵල නිසා සිදු වූ බවයි. මෙය ධාවනය වන බස් රථයක රියදුරු සහ කොන්දොස්තර අතර ආරවුලක් විසඳීම පිණිස බස් රථයේ එන්ජිම ගැලවීමට යෝජනා කිරීම වැනි ප්‍රතිකාරයක් ලෙසටයි

හැඳින්විය හැක්කේ. බස්රථයේ දෝෂය තිබෙන්නේ රියදුරු සහ කොන්දොස්තර අතර නම් එහි එන්ජිම මාරු කිරීම අර්ථ විරහිත ක්‍රියාවක් බව අමුතුවෙන් කිව යුතු නැහැ.

ඉදිරිපත් කොට ඇති 20 සංශෝධනය මඟින් කොමිෂන් සභා කිහිපයක බලතල අඩු කිරීමත් සැලකිල්ලට ගත යුතු කාරණයක්. මැතිවරණ කොමිෂන් සභාවේ බලතල අඩු කරනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල විශාල වශයෙන් අඩු කරනවා. රාජ්‍ය සේවය සෘජුවම අමාත්‍ය මණ්ඩලය යටතටම ගනු ලබනවා. පොලිස් කොමිෂන් සභාවේ බලතල සම්පුර්ණයෙන්ම අඩු කොට එය තනිකරම මහජන පැමිණිලි විභාග කරන ආයතනයක් බවට පත් කරනවා. විගණකාධිපතිවරයාගේ බලතල අඩු කරනු ලබනවා. විගණකාධිපතිවරයාගේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තා මඟින් තමයි පාර්ලිමේන්තුවට මුදල් පාලන බලයක් ලැබෙන්නේ. මේ අනුව පාර්ලිමේන්තුවේ මුල්‍ය අධික්ෂණය කියන කාරණයත් ඉබේම සීමා වෙනවා.

1978 ව්‍යවස්ථාව සකස් කරන ලද මීට හතලිස් වසරකට ඉහත තිබු තත්ත්වයට වඩා අද රාජ්‍ය ව්‍යවසායකත්වය ක්‍රියාත්මක වන්නේ රාජ්‍ය සතු සමාගම් ලෙසට. අමාත්‍යාංශවල මුල්‍ය ප්‍රතිපාදනවලින් වැඩි හරියක් පාවිච්චි කරන්නේ මෙම සමාගම් විසින්. උදාහරණයක් ලෙසට විදුලි බල මණ්ඩලයේ වැඩි ප්‍රතිශයක් ප්‍රාග්ධන සංසරණය වන්නේ ලක් දනව්, ලංකා ට්‍රාන්ස්ෆෝමර්, ලේකෝ වැනි සමාගම් හරහායි. රාජ්‍ය සමාගම් 156 ක් රාජ්‍ය විගණනයෙන් ඉවතට යෑම පාර්ලිමේන්තුවේ මුල්‍ය පාලනය සීමා කිරීමක්. ජනාධිපතිවරයා අමාත්‍යාංශ ලේකම්වරු පත් කරන අතරම මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ද සෑම අමත්‍යාංශ ලේකම්වරයෙකුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙසටද පත් වීමක් දෙනු ලබනවා. රාජ්‍ය විගණනය නොමැති නම් ඔහු ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙසට සිය රාජකාරිය ඉටු කළ නොහැකි තත්ත්වයක් ඇති වෙනවා. පෞද්ගලික විගණන සමාගම් විසින් කරනු ලබන විගණන එම ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල අවශ්‍යතා අනුව සිදුවන්නක් ලෙසට අනුමාන කළ හැකියි. පෞද්ගලික විගණනය මඟින් රාජ්‍ය සම්පත් අයුතු ලෙස භාවිතා කිරීම නියාමනය කළ නොහැකියි.

මේ සියල්ලම වෙනස් වෙද්දි ප්‍රසම්පාදන සහ විගණන කොමිෂන් සභා දෙකත් අහෝසි කරනු ලබනවා.

> **ව්‍යවස්ථා සභාව යටතේ තිබු රාජ්‍ය ආයතන විධායකය විසින් පාලනය කරන වටපිටාවක් 20 වැනි සංශෝධනය මඟින් ඇති කරනු ලබනවා**

20 සංශෝධනය යනු 18 සංශෝධනය තිබු තත්ත්වයට ආපසු යාමක් ලෙසට තර්ක කරනවා. මෙය අර්ථ නිරූපණ පනතට අනුව පිළිගත නොහැකි තර්කයක්. එම පනතට අනුව අතීතයේ ඉවත් කළ යම් නීතියක් වර්තමානයේ යළි සාකච්ඡාවට ගත නොහැකියි. මේ නිසා 20 සංශෝධනය යළිත් 18 වැනි සංශෝධනය කරා යාමක් ලෙස ඉදිරිපත් කරන තර්කය වැරදියි.
හදිසි පනත් ගෙන ඒම සම්බන්ධයෙන්

කර තිබෙන යෝජනාවද බරපතළ ලෙස සැලකිල්ලට ගත යුතුයි. සුනාමියක් හෝ වසංගත තත්ත්වයක් වැනි ජාතික හදිසි තත්ත්වයක් උදා වූ අවස්ථාවක එම තත්ත්වයට මුහුණ දීම පිණිස, හදිසි පනත් ගෙන ඒමට රජයකට අයිතියක් තිබිය යුතු යැයි කෙනෙකුට තර්ක කළ හැකියි. 1978 සිට මේ දක්වා කොපමණ හදිසි පනත් සංඛ්‍යාවක් ගෙනවිත් තිබෙනවාද ? මහජනතාවගේ පැත්තතෙන් බලන කළ මේවා හදිසි පනත්ද යන්න ප්‍රශ්නයක්. 18 සංශෝධනය හදිසි පනතක් හැටියට ගෙන ආවේ 2010 වර්ෂයේ. ඒ අනුව මහා මැතිවරණය පවත්වන්නට නියමිත වුයේ 2016 හෝ 2017 වර්ෂයේ. එතකොට මැතිවරණ තියන්න කිසිම හදිස්සියක් නැහැ. මෙතෙක් ඉදිරිපත් කර තිබෙන හදිසි පනත් බැලුබැල්මටම පේනවා හදිසියකට ගෙන ආ පනත් නොවේ කියලා. එම පනත්වලින් ජනතාව පීඩාවට පත් කිරීමට හදිස්සියක් තිබුණා දැයි ප්‍රශ්න කළ හැකියි. හදිසි පනත් ගෙන ඒමේ ක්‍රියාවලිය තුළ බලධාරින්ගේ සැඟවුන න්‍යාය පත්‍රයක් තිබෙන්නට පුළුවන්. මෙම තත්ත්වය 20 මගින් නැවත ගෙන එන්නට යෝජනා කොට තිබෙනවා. මෙය අභියෝගයට ලක් කළ යුතුයි.

සාමාන්‍ය පනත් ඉදිරිපත් කරන විට 19 සංශෝධනයට කලින් තිබුණේ දින 7කට පෙර ඉදිරිපත් කළ යුතුයි යන නීතිමය ප්‍රතිපාදනය. මෙය 19 සංශෝධනය විසින් දින 14 දක්වා දිර්ඝ කළා. නැවත 20 සංශෝධනය මගින් දින 7 දක්වා ගෙන ගොස් තිබෙනවා.

විදේශීය පුරවැසිභාවය පිළිබඳ 19 සංශෝධනයේ නීතිමය වගන්ති, 20 සංශෝධනය මගින් අහෝසි කිරීමට යෝජනා කොට තිබෙනවා.

20 සංශෝධනයේ මූලික හරය ගත් කළ එය ප්‍රජාතන්ත්‍රවාදයට පමණක් නොව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට, මාධ්‍ය නිදහසට පවා තර්ජනයක් එල්ල වෙනවා. මූලික අයිතිවාසිකම් ගණනාවක් හැකිලි යනවා. 1978 ව්‍යවස්ථාව යටතේ පවා පාර්ලිමේන්තුවට තිබු බලතල රාශියක් 20 සංශෝධනයෙන් ඉවත් කර තිබෙනවා.

මෙය හරියට සැමුවෙල් රොඩ්රිගෝ ගේ විනෝද සමය වැඩසටහන් මාලාවේ සම්මුඛ පරීක්ෂණය නැමති වැඩසටහනේ දක්නට ලැබුණ අනවශ්‍ය අය නෙරපීමේ සිදුවීමට සමානයි. එහිදි සිදුවුණේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවුම් ලැබු තැනැත්තෙක් ආයතන ප්‍රධානියාගේ හිත දිනා ගෙන ආයතනයට කරදර කරන තැනැත්තන් නෙරපා දමන්නට ලිඛිත බලයක් ලබා ගන්නවා ඔබට මතක ඇති. අවසානයේදි මේ තැනැත්තා ආයතන ප්‍රධානියා පවා නෙරපා හරිනවා. මෙම ක්‍රියාව ආයතන ප්‍රධානියා විසින් අභියෝගයට ලක් කරන විට අර තැනැත්තා තමාට ඔහුවත් නෙරපීමට ලිඛිත බලයක් තිබෙන බව පෙන්වා දෙනවා.

20 වැනි සංශෝධනයෙන්ද මෙවැනි තත්ත්වයක් නිර්මාණය විය නොහැකියැයි කාට නම් කිව හැකිද?

අද වන විට නැවත උද්ගතව ඇති කොවිඩ්-19

# අරමුණ පැහැදිලි කිරීම සහ පිළිගැනීම


**සීතා රංජනී**

**කැඳවුම්කරු, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**




වසංගත තත්ත්වය යටතේ සමාජය තුළ පවතින ආතතික තත්ත්වය සමඟ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විදිහට කුඩා කණ්ඩාමක් සමඟ හෝ මේ සාකච්ඡාව සිදු කරන්නට අදහස් කළේ කරුණු කිහිපයක් පිළිබඳ අවධානයෙන් යුතුවයි. ප්‍රජාතන්ත්‍රවාදය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සහ මාධ්‍ය නිදහසට, 20 වැනි සංශෝධනය බලපාන ආකාරය පිළිබඳ අපේ මතය කවර බාධක මධ්‍යයේ වුවත් ප්‍රකාශ කිරීමේ වගකීමක් අපිට තිබෙනවා. කොවිඩ් 19 කලබලය නිසා අප නිශ්ශබ්දව සිටින අතරේ පාර්ලිමේන්තුවද නිශ්ශබ්දව මෙම පනත කෙටුම්පත සම්මත කර ගැනීමට ඉඩක් තිබෙනවා. ඒ වගේම 20 වැනි සංශෝධනය සම්බන්ධයෙන් අප කොතෙක් සංවාද කළත්, ඒවා 20 වැනි සංශෝධනය ඒ ආකාරයෙන්ම සම්මත කර ගැනීමේ වැඩ පිළිවෙලට අභියෝග යක් ද නොවිය හැකියි. ඒ වගේම අද අපේ මාධ්‍ය හැසිරෙන ආකාරය නිරික්ෂණය කරන විට පෙනී යන්නේ 20 සංශෝධනය සම්බන්ධයෙන් දේශපාලනඥයින්ගේ වොයිස් කට්ස් ප්‍රචාරය කරනවා හැර දැනුවත් සංවාදයකට මග පෙන්වන්නේ නැති බවයි.

සැප් 16 වන දින නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විදිහට අපි නිකුත් කළ මාධ්‍ය නිවේදනයෙන්, 20වන සංශෝධනයේ වගන්තියෙන් වගන්තියට විශ්ලේෂණය නොකර නමුත් බැලූ බැල්මට ප්‍රජාතන්ත්‍රවාදයට සහ මාධ්‍ය නිදහසට එයින් ඇති වන තර්ජනය පෙන්වා දුන්නා. ස්වාධීන කොමිසන් සභා තව දුරටත් ස්වාධීන නොවීම හරහා සිදු විය හැකි අනතුර අපි එයින් ප්‍රකාශ කළා. ව්‍යවස්ථාදායක සභාවට තිබූ නාම යෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාව අහෝසි කොට ජනාධිපතිවරයා කැමැති පුද්ගලයන් පත් කිරීමෙන් සිදු

වන අයහපත පෙන්වා දුන්නා. රජයේ සියලු වගකිව යුතු නිලධාරීන් පත් කිරීම, ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයාට හිමි වීමෙන් සිදු විය හැකි නපුර පෙන්වා දුන්නා. මැතිවරණ කොමිසම ස්වාධීන නොවීමෙන් මැතිවරණ නිදහස් හා සාධාරණ වේද? ජනතාවට තමන්ගේ කැමැත්ත නිදහසේ ප්‍රකාශ කරන්නට ලැබේද යන කරුණු මතු කළා.

මෙම සංවාදයේ අරමුණ, 20වැනි සංශෝධනය පිළිබඳව ඊට වඩා ගැඹුරින් ප්‍රජාතන්ත්‍රවාදයට අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට සහ මාධ්‍ය නිදහසට බලපාන ආකාරය සංවාදයට ලක් කිරීමයි. මේ සඳහා අදහස් දැක්වීම පිණිස අපි තෝරා ගත්තේ මෙම විෂය සම්බන්ධයෙන් නිරන්තරයෙන්ම ක්‍රියාකාරි තිදෙනෙක්. කේ.ඩබ්.ජනරංජන නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ සාමාජිකයෙක් මෙන්ම මීට පෙර තනතුරු ද දැරූ තැනැත්තෙක්, නීතිඥවරයෙක් සහ අනිද්දා පුවත්පතේ කර්තෘවරයා. ඔහු සිය අනිද්දා පුවත්පත ඔස්සේ 20 වැනි සංශෝධනයේ අනතුර පිළිබඳ විශාල අරගලයක් කරමින් සිටිනවා. නීතිඥ ජගත් ලියන ආරච්චි මහතාත් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ විධායක කමිටු සාමාජිකයෙක්. පර්යේෂකයෙක් මෙන්ම ලේඛකයෙක් දේශකයෙක් වෙනවා. අර්මිසා ටිගල් අධිකරණ පද්ධතිය තුළ ක්‍රියාකාරි නීතිඥවරියක් මෙන්ම 20 වැනි සංශෝධනයට විරුද්ධව අධිකරණයට ඉදිරිපත් වූ පෙත්සම් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරියක් වෙනවා. ඇය මෙම සංවාදයට දායක වන්නේ අධිකරණයේ දැනට විභාග අවසන් කොට ඇති පෙත්සම් සම්බන්ධයෙන් අදහස් දැක්වීමට නොව, 20 වැනි සංශෝධනය අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට බලපාන්නේ කෙසේද යන කාරණය ගැනයි. කොවිඩ්-19 දැඩි වසංගත තත්ත්වය නොසලකා මෙම සංවාදය සමාජ දේශපාලනය සම්බන්ධයෙන් වැදගත් කාර්යක් ලෙස සලකා මෙහි පැමිණිම ගැන ඒ තිදෙනාටම ස්තුතිවන්ත වෙමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙනුවෙන් ඔවුන් තිදෙනාම පිළිගැනීමට කැමතියි. මෙම අවස්ථාවට සහභාගි වීමට පැමිණි මාධ්‍යවේදීන් විද්වතුන්, සමාජ ක්‍රියාකාරිකයන් සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ විධායක සභිකයින් මෙන්ම සාමාජිකයින් සියලු දෙනාමත් මම ගෞරවයෙන් පිළි ගැනීමට කැමැතියි.



ප්‍රජාතන්ත්‍රවාදය, අදහස් ප්‍රකාශ කිරීමේ
අයිතිය, මාධ්‍ය නිදහස සහ
**20 වැනි සංශෝධනය**

Free Media Movement (FMM)
96, Bernard Soysa Mw, Colombo 05
Sri Lanka

Tel : +94 -11-236 8895
Web: www.fmmsrilanka.lk
Web: www.mediareform.lk
Facebook: www.facebook.com/fmm.srilanka
Twitter: www.twitter.com/FMMsrilanka

Designed by: Haritha Dahanayaka